නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
திர்மாணக் கைத்தொழில் அபிவிருத்தி அதிகாரசபை
CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY

CETRAC
CONSTRUCTION EQUIPMENT TRAINING CENTRE

ලංසු සඳහා ආරාධනයයි

බත්තරමුල්ල, පැලවත්ත, අංක 17, ඩී. පී. විජේසිංහ මාවතේ පිහිටි ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) පරිපාලන, ආපනශාලා සහ නේවාසිකාගාර ගොඩනැගිල්ලේහි වහලයේ ජලරෝධක (Water Proofing) පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම

ප්‍රසම්පාදන අංකය: 1/4/7/00/146-2026

1. මෙම ලංසු සඳහා ආරාධනය, 2026.10.28 දිනැති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) අංක 1/4/7/00/146-2026 දරන ප්‍රකාශනයෙහි පළ වූ මෙම ව්‍යාපෘතිය සඳහා වන සාමාන්‍ය ප්‍රසම්පාදන දැනුම්දීමට අනුකූල වේ.

2, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC - ප්‍රධාන) සභාපති විසින් පහත දක්වෙන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) පරිපාලන, ආපනශාලා සහ නේවාසිකාගාර ගොඩනැගිලිලෙහි වහලයේ ජලරෝධක පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත් ශීර්ෂය	CIDA අවම ශ්‍රේණිය සහ විශේෂඥ ක්ෂේත්‍රය	ඉදිකිරීම් කාලසීමාව (දින)
ඉදිකිරීම් උපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ (CETRAC) පරිපාලන, ආපනශාලා සහ නේවාසිකාගාර ගොඩනැගිලිවල වහල ස්ලැබ්හි ජලරෝධනය ප්‍රතිසංස්කරණය කිරීම	ජලරෝධක සඳහා SP3 සහ ඊට ඉහළ	91

මෙම කාර්යයට පවතින සිමෙන්ති බ්ලොක්, පැරණි ජලරෝධක ස්තරය ඉවත් කිරීම, පැරණි ප්‍රයිමර් ස්තරය සූරා කොන්ක්‍රීට් මතුපිට නිරාවරණය කිරීම, පවතින බිත්ති කපරාදුව මි.මී. 300 ක උසකට ඉවත් කර නැවත කපරාදු කිරීම ඇතුළත් වේ.

වැඩබිම පිහිටා ඇත්තේ: ඉදිකිරීම් උපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය (CETRAC), අංක 17, ඩී. පී. විජේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

3. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 42 කි.

4. ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රමවේදය හරහා සිදු කරනු ලැබේ.

5. සුදුසුකම්ලත් ලංසුකරුවන් පහත සඳහන් සාමාන්‍ය හා විශේෂිත නිර්ණායක සපුරාලිය යුතුය:

- පසුගිය වසර 10 තුළ සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 50 ක් විය යුතුය.
- සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති දැක්වෙන CIDA ලියාපදිංචි වාර්තා පොතේ අදාළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- පසුගිය වසර 10 තුළ සමාන ස්වභාවයේ සහ සංකීර්ණතාවයෙන් යුත් ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය.
- අවශ්‍ය වන අවම ද්‍රවශීල වත්කම් හෝ ණය පහසුකම් ප්‍රමාණය රුපියල් මිලියන 42 කි.
- ලංසුකරුවන් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි වී තිබිය යුතු අතර, අදාළ වන පරිදි වලංගු ලියාපදිංචි සහතිකය ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. තවද පොදු කොන්ත්‍රාත් පනත යටතේ නිකුත් කර ඇති සියලුම අදාළ සංශෝධන, රෙගුලාසි සහ උපදෙස්වලට අනුකූල විය යුතුය.

6. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ඉදිකිරීම් උපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ (CETRAC) අධ්‍යක්ෂ/ඉ.යා.සේ, ඉංජිනේරු ජේ. ඒ. එන්. එන්. කේ. ජයකොඩි මහත්මියගෙන් 0112-784413 සහ jnimanthi@gmail.com හරහා ලබා ගත හැකි අතර, 2026.10.28 සිට 2026.11.16 දක්වා සාමාන්‍ය වැඩකරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා සම්පාදන අංශයෙන් ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කළ හැක.

7. ආපසු නොගෙවන ගාස්තුවක් වන රු. 8,000.00 ක මුදලක් ගෙවීමෙන් සහ පහත සඳහන් ලිපිනයට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අභිලාෂීලංසුකරුවන්ට,ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද ලංසු ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් CIDA හි සරප් වෙත මුදලින් කළ යුතු වේ.

8. ලංසු 2026.11.17 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ 2026.11.17 දින ප.ව. 2.30 ට පහත සඳහන් ලිපිනයේදී ලංසු විවෘත කරනු ලැබේ. මුල් පිටපත සහ අනු පිටපත වෙන වෙනම බහාලූ කවර අඩංගු මුද්‍රා තැබූ පිටත කවරයේ ඉහළ වම්පස කෙළවරේ"Renovation of Waterproofing on Roof Slab of Administration, Canteen & Dormitory Building at Construction Equipment Training Centre (CETRAC)"ලෙස සටහන් කළ යුතුය.

9. සියලුම ලංසු සමඟ ලබා දී ඇති ආකෘතියට අනුව 2027.03.16 දක්වා වලංගු රු. 418,000.00 ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර ලංසු 2027.02.16 දක්වා වලංගු විය යුතුය.

10. ඉහත වගන්තිගි යොමු කොට ඇති ලිපිතය/ලිපින පහත පරිදි වේ

සැපයුම් අංශය,
2 වන මහල, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
"සවිසිරිපාය", අංක: 123,
විජේරාම මාවත, කොළඹ 07.

සභාපති (ප්‍රසම්පාදන කමිටුව - ප්‍රධාන),
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
සවිසිරිපාය, 123, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන : 011 2 699 801, 011 2 686 092 / ෆැක්ස්: 011 2 699 738
විද්‍යුත් තැපෑල : ictadsupply@gmail.com /වෙබ් අඩවිය: www.cida.gov.lk
2026.10.28